Sannasa Sports

# දඟ පන්දුවේ තාරුණ්‍යය

ක්‍රීඩකයකුට තම රට නියෝජනය කිරීමේ අවස්ථාව උදා කර ගත හැකි වන්නේ ඔහු හෝ ඇය එම ක්‍රීඩාවේ අතිදක්ෂයකු ලෙස දස්කම් පෙන්වන විටදී ය. ශ්‍රී ලංකා ක්‍රිකට් පිටියට එවැනි අති දක්ෂයන් මෙන්ම අසාමාන්‍ය දක්ෂකම් ඇති ක්‍රිඩකයන්ද විටින් විට එක්වීම නිසාම වෙන කවර ක්‍රීඩාවකටත් වඩා ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලොව ඉදිරියේම සිටින්නට ශ්‍රී ලංකාවට භාග්‍යය ලැබී ඇත. මෑතකදී බිහිවූ එවැනි දක්ෂ ක්‍රීඩකයන් ලෙස අරවින්ද අර්ජුන වාස් සංගක්කාර මෙන්ම විශේෂයෙක් කැපී පෙනෙන මුරලි හා සනත් ද නම් කළ හැකි ය. මෙවර සන්නස ක්‍රීඩා පිටුව වෙන්වන්නේ ඔවුන් වෙනුවෙන් නොව ශ්‍රී ලංකාවේ නවතම සොයැගැනීම වෙතටයි. ඔහු වෙන කිසිවකු නොව පසුගිය ආසියා කුසලාන ක්‍රිකට් තරගාවලියේදී මුලු ලොවේම අවධානය තමා වෙතට දිනා ගත් අජන්ත මෙන්ඩිස් ය.

ආසියා කුසලාන තරගාවලියේ හොඳම ක්‍රීඩකයාට හිමි සම්මානය පවා දිනාගත් අජන්ත අවසන් තරගයේදී කළ පන්දු යැවීම මෑත කාලයේ ක්‍රීඩා ලෝලීන්ට දැක ගන්නට ලැබුණු ඇදහිය නොහැකි අන්දමේ විස්මිත එකක් යයි සඳහන් කළ හැකි ය. එහිදී ලකුණු 13 කට කඩුලු 6 ක් ලබාගත් අජන්ත යැවූ පන්දු ලෝක පූජිත ඉන්දියානු පිතිකරුවන්ට පමණක් නොව විස්තර ප්‍රචාරක අට්ටාල වල සිටි ලෝක පූජිත ක්‍රීඩා විචාරකයන්ටවත් තේරුම් ගැනීමට නොහැකි වූ බවක් දැකගන්නට ලැබුණි. ආසියා කුසලාන තරගාවලිය නිමවත්ම ලොව පුරා මාධ්‍ය වලින් ඔහුට බේරුමක් නම් නොවී ය. ලක්මවට දාව තවත් විස්මිත පන්දු යවන්නකු උපත ලබා ඇති බව පසුවදාම මේ මාධ්‍ය ලොවට වාර්තා කළේ ය.

අප ඔහු සමග පැවැත්වූ කෙටි පිළිසඳර යි මේ.



## - අජන්ත මෙන්ඩිස්

ඔබ ක්‍රිකට් ක්‍රීඩාවට යොමු වුණේ කොහොම ද?

මාත් අනිත් හැම ළමයෙක් වගේම යාලුවන් එක්ක එකතු වෙලා ගමේ ඇවිද ඇවිද ක්‍රිකට් ගැහුවා. මං ඉගෙන ගත්තෙ කඩලාන ශාන්ත අන්තෝනි විද්‍යාලයේ. ඒ කාලෙ ලකී රොජර්ස් මහත්තයා ක්‍රිකට් පුහුණු කඳවුරක් දැම්මා මොරටුවේ. මොන විදිහකින් හරි මටත් ඒකට සහභාගි වෙන්න අවස්ථාව ලැබුණා. පුහුණුව අවසානයේ ඔහු මට කතා කර කිව්වා ඔබට හොඳ පන්දු යවන්නෙක් වෙන්න පුලුවන්. මම මොරටු විද්‍යාලයට ඇතුල් වෙන්න උදව් කරන්නම් කියලා. ඒ අනුව මම මොරටු විද්‍යාලයට ඇතුල් වී 2001 2002 වසර දෙක විද්‍යාල කණ්ඩායම නියෝජනය කළා. එම වසර දෙකේම හොඳම පන්දු යවන්නා වෙන්න මට පුලුවන් වුණා. පාසලේ ක්‍රිකට් පුහුණු කළ ප්‍රසන්න දිසානායක මහතාගෙන් මගේ ක්‍රීඩා දිවියට ලැබුණ ගුරු හරුකම් ඉතා කෘතඥතා පූර්වකව සිහිපත් කරන්න කැමතියි.

පාසලෙන් සමු ගත් පසුව

මම ආදි මොරටු විද්‍යාල ක්‍රිකට් සමාජයට එක් වී ක්‍රීඩාව කරගෙන ගියා. ඒ කාලයේ මට රැකියාවක අවශ්‍යතාව තදින්ම දැනිලා තිබුණා. කොහොම හරි ශ්‍රී ලංකා යුද හමුදාවේ කාලතුවක්කු බලකායේ 4 වන රෙජිමේන්තුවේ සෙබලෙකු ලෙස සේවයට බැඳෙන්න මට පුලුවන් වුණා.

ඔබ දැන් සාමාන්‍ය සෙබලෙක් නෙවේය. නිලධාරියෙක්. ඒ ගැන ඔස්ට්‍රේලියාවේ ක්‍රීඩා ලෝලීන් සමග අපත් සුබ පතනවා.

බොහොම ස්තුතියි. යුද හමුදාවේ දෙවන ලුතිනන් තනතුරට උසස් වීමක් ලැබුණා ආසියා කුසලානයෙන් පස්සෙ. මගේ ගමනට විශාල පිටුවහලක් ලැබුණා යුද හමුදාවෙන්. ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඉදිරියට යන්න අවශ්‍ය හැම පහසුකමක්ම යුද හමුදාවෙන් ලැබුණා. මගේ පුහුණු වීම් කටයුතු කිරීමට ඉදිරියට එන්න මට විශාල සහයෝගයක් දුන්න සමන් හේවාවිතාරණ සහ නීල් රාජපක්ෂ යන පුහුණු කරුවන් ඉතා ගෞරවයෙන් සිහිපත් කරන්න කැමතියි.

ඔබේ පවුලේ තොරතුරු

මගේ පියා රැකියාව ලෙස කළේ වඩු වැඩ. ඕනෙම දෙයක් හරියට කරන්න කියමින් ඔහු නිතරම මාව දිරි ගැන්නුවා. අසාවනාවට මෙන් මා යුද හමුදාවට බැඳුණ කාලයේම ඔහු අපෙන් සදහටම සමු ගත්තා. මට අක්කයි අයියයි නංගියි මල්ලියි යන හැම වර්ගයකම සහෝදර සහෝදරියන් ඉන්නවා. මල්ලි කතෝලික පූජකවරයෙක් වීමට පුහුණු වෙනවා. කුඩා කල සිට අම්මගෙ එකම රාජකාරිය අපි පස් දෙනාගේ දුක සැප බලමින් අප ඉදිරියට ගේන්න වෙර දැරීමයි. ඒ වෙනුවෙන් ඈ කළ කැපකිරීම් අපමණයි.

ඔබ මොන ආකාරයේ පන්දු යවන්නෙක් ද? පා දඟ පන්දු පිට දඟ පන්දු ගුග්ලි ආදී මෙකී නොකී හැම ආකරයකින්ම ඔබ පන්දු යවන බව අප දුටුවා.

මං සාමාන්‍යයෙන් පිට දඟපන්දු (Off Break) යවන්නෙක්. ඒත් අවස්ථාවේ හැටියට වෙනත් ආකාරයන්ට පන්දු යවමින් පිතිකරුවන්ට තර්ජනයක් එල්ල කරන්න මම උත්සාහ ගන්නවා. විශේෂයෙන් ශ්‍රී ලංකා පිලට එක්වීමෙන් පසුව මගේ පුහුනු කරු ලෙස කටයුතු කළ රුවන් කල්පගේ සහ යුද හමුදාවේදී මගේ පුහුණු කරු වූ නීල් රාජපක්ෂ යන අ යමට නිතරම දීපු උපදෙසක් තමයි පිතිකරුවන්ට තර්ජනයක් වීමට නම් විවිධ ආකාරයට පන්දු යැවිය යුතු බව.

ඔබේ ක්‍රිකට් දිවියේ අමතක නොවන සිදුවීම් තිබෙනවා ද?

ශ්‍රී ලංකාව නියෝජනය කරන්න ලැබීම මට කවදාවත් අමතක කරන්න බැහැ. ඒ 2008 අප්‍රේල් 10 දා. මට ඒ අවස්ථාව උදා වෙන්න හේතු වුණේ වයඹ පළාත් කණ්ඩායම නියෝජනය කරන්න ලැබුණ වෙලාවෙ මං දක්වපු දස්කම් නිසා යයි මට හිතෙනවා. ඒ වගේම මගේ මතකයේ වඩාත්ම රැඳී ඇති අවස්ථාවක් තමයි බටහිර ඉන්දීප පිලේ ක්‍රිස් හේල් දවාගත්ත අවස්ථාව.

ඔබේ අනාගත බලාපොරොත්තු මොනවාද?

බ්‍රිකට් ක්‍රීඩාව දියුනු කරගෙන ශ්‍රී ලංකාවට ජයග්‍රහණ ලබාදෙන්න උත්සාහ කරනවා. පිතිකරුවකු ලෙස අවශ්‍ය අවස්තාවකදී දස්කම් දක්වන්න පිතිහරමය දියුණු කරගන්නත් කැමතියි.

දක්ෂ වඩු කාර්මිකයකු වූ ඔහුගේ පියාණන් නියනකින් ලී මත කැපූ හැඩතල රවුම් ලියවැල් අද ඔහුගේ පුතණුවන් තණතිල්ල මත පන්දුවකින් මවන්නා සේ ය. ජීවිතය ජය ගැනීමට වෙර දරන 23 හැවිරිදි මෙම තරුණ ක්‍රිඩකයාට තව තවත් ඉදිරියට යාමට අවශ්‍ය ධෛර්යය හා ශක්තිය තව තවත් ලැබේවායි ප්‍රාර්ථනා කරමින් අපි ඔහුගෙන් සමුගත්තෙමු.

**ආසියා කුසලාන තරගාවලියේ හොඳම ක්‍රීඩකයාට හිමි සම්මානය පවා දිනාගත් අජන්ත අවසන් තරගයේදී කළ පන්දු යැවීම මෑත කාලයේ ක්‍රීඩා ලෝලීන්ට දැක ගන්නට ලැබුණු ඇදහිය නොහැකි අන්දමේ විස්මිත එකක් යයි සඳහන් කළ හැකි ය. එහිදී ලකුණු 13 කට කඩුලු 6 ක් ලබාගත් අජන්ත යැවූ පන්දු ලෝක පූජිත ඉන්දියානු පිතිකරුවන්ට පමණක් නොව විස්තර ප්‍රචාරක අට්ටාල වල සිටි ලෝක පූජිත ක්‍රීඩා විචාරකයන්ටවත් තේරුම් ගැනීමට නොහැකි වූ බවක් දැකගන්නට ලැබුණි. ආසියා කුසලාන තරගාවලිය නිමවත්ම ලොව පුරා මාධ්‍ය වලින් ඔහුට බේරුමක් නම් නොවී ය. ලක්මවට දාව තවත් විස්මිත පන්දු යවන්නකු උපත ලබා ඇති බව පසුවදාම මේ මාධ්‍ය ලොවට වාර්තා කළේ ය.**

අසෝක සිල්වා